සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2026
Year End Evaluation

ශ්‍රේණිය தரம் Grade	විෂයය பாடம் Subject	පත්‍රය வினாத்தாள் Paper	කාලය காலம் Time
10	බුද්ධ ධර්මය	I,II	පැය 03

නම/විභාග අංකය:.....

I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(01) උපගාන්ත පැවිදි රුව ගැන සිත යොමුකරමින් සිටි බෝසතාණන් වහන්සේට මාලිගාවෙන් පැමිණි පණිවුඩකරුගෙන් අසන්නට ලැබුණේ,
1. තම පියාණන් අසනීප වූ බවයි.
2. තම දේවිය පුතකු ලද බවයි.
3. තම රාජ්‍යයට සතුරන් පැමිණි බවයි.
4. තම දේවිය අසනීප වූ බවයි.

(02) හදු යෞවනයේ පසුවන්නාකුට පස්කම් සැපය අත්හැරීම පහසු කටයුත්තක් නොවේ. එනමුත් සත්විනි රජකම ද යශෝධරාව ද පුත් කුමරු ද බොහෝ සම්පත් ද අත්නැරීම බෝසත් සිරිතෙන් ප්‍රකට වෙයි. එය හඳුන්වන්නේ,
1. මහා පරිනිබ්බානය නමිනි.
2. මහා ධර්මචක්‍ර ප්‍රවර්ත්තනය නමිනි.
3. මහා සම්බුද්ධත්වය නමිනි.
4. මහා අභිනිෂ්ක්‍රමණය නමිනි.

(03) පිංකම් පිළිබඳ ව, චාරිත්‍ර වාරිත්‍ර ඉටු කිරීම පිළිබඳ ව, පවිත්‍ර ව, ක්‍රමවත් ව, සංවිධානාත්මක ව ශ්‍රද්ධාව උපදවමින් කටයුතු කිරීම පිළිබඳ ව බොහෝ දේ අපට හුරුපුරුදු වූයේ,
1. යහළුවන් මඟිනි.
2. පාසල මඟිනි.
3. පන්සල මඟිනි.
4. සමාජ ඇසුර මඟිනි.

(04) භාවනා කිරීමේ දී හිඳීම, සිටීම, ඇවිදීම ආදි සියලු ක්‍රියාවන්හි දී අවබෝධයෙන් කටයුතු කිරීම හඳුන්වන්නේ,
1. ඉන්ද්‍රිය සංවරය නමිනි.
2. සති සම්පජඤ්ඤ නමිනි.
3. සත්තූපට්ඨානා නමිනි.
4. අවෙච්චප්පසාදය නමිනි.

(05) බුදු දහමේ ඉගැන්වෙන ප්‍රධාන ඉගැන්වීමකි, ත්‍රිලක්ෂණය. එය පිළිබඳ ව මහා අවිද්‍යයෙන් යුත් පුද්ගලයා ගත කරන්නේ,
1. අල්පේච්ඡ ජීවිතයකි.
2. ගරු ගාම්භීර ජීවිතයකි.
3. විඩාබර ජීවිතයකි.
4. අවිචාරවත් ජීවිතයකි.

(06) තමා ජීවත් වන පරිසරයේ දී මුහුණ දීමට ඇති අවුල් සියල්ල නිරවුල් කරගැනීමට අප වැඩිය යුතු භාවනාව වන්නේ,
1. සමථ භාවනාව යි.
2. විදර්ශනා භාවනාව යි.
3. සමාධි භාවනාව යි.
4. චිත්ත භාවනාව යි.

(07) බුදුරජාණන් වහන්සේ සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස පහක් දේශනා කළ සේක. එම ආනිසංසවලට අයත් නොවන්නේ,
1. මහත් වූ භෝග සම්පත් අත්පත් කර ගැනීමයි.
2. ප්‍රශංසා පැතිරීම යි.
3. මිනෑ ම පිරිසක් මැදට නිර්භය ව එළඹීමට හැකි වීමයි.
4. මරණින් මතු දුගතියෙහි උපත ලැබීම යි.

Past Papers Wiki

(08) සිදුහත් කුමරු සරණ පාවා ගත් යශෝදරා කුමරිය,

1. ශාක්‍ය රාජ වංශික කුමරියකි.
2. කෝලිය රාජ වංශික කුමරියකි.
3. මගධ රාජ වංශික කුමරියකි.
4. අවන්ති රාජ වංශික කුමරියකි.

(09) බුදුරජාණන් වහන්සේගේ පා සටහන් මහ මග සලකුණු වී තිබෙනු දැක ඒ පිළිබඳ ව විමසිලිමත් වෙමින් ඒ පා සටහන් කාගේ දැයි සොයා ගියේ,

1. අග්ගික භාරද්වාජ බමුණා ය.
2. ද්‍රෝණ බමුණා ය.
3. සොත්ථිය බමුණා ය.
4. සංකිච්ච බමුණා ය.

(10) බුද්ධ දේශනාවේ සඳහන් වන "සමග්ගා හෝථ මා විවදථ" යන පාඨයෙහි අර්ථය වන්නේ,

1. 'සමගිය ම යහපති' යන්න ය.
2. 'සමගිවන්න විවාද නොකරන්න' යන්න ය.
3. 'සමගිය ම බලය වේ' යන්න ය
4. 'සමගිය සහජීවනයට මග ය' යන්න ය.

(11) ජාතික ආගමික සහජීවනය බුදුදහම කිසිසේත් ම බැහැර නොකරයි. මේ සඳහා අදාළ නොවන දේශනාව වන්නේ,

1. චතුරාර්ය සත්‍ය දේශනාව යි.
2. පටිච්ච සමුප්පාද දේශනාව යි.
3. ත්‍රිලක්ෂණ දේශනාව යි.
4. පුනර්භවය පිළිබඳ දේශනාව යි.

(12) දෙවන ආත්මභාවයෙන් පසු කවර හෝ ආත්මභාවයක දී විපාක දෙන කර්ම හඳුන්වන්නේ,

1. දිට්ඨධම්මවේදනීය කර්ම නමින් ය.
2. උපපජ්ජවේදනීය කර්ම නමින් ය.
3. අපරාපරියවේදනීය කර්ම නමින් ය.
4. අහෝසි කර්ම නමින් ය.

(13) දුගි පවුලක උපත ලැබුව ද උසස් රූප ශෝභාව නිසා වාසනාවන්ත ජීවිතයක් ගත කිරීමට අවස්ථාව උදා වන්නේ,

1. ගති සම්පත්තිය නිසා ය.
2. උපධි සම්පත්තිය නිසා ය.
3. කාල සම්පත්තිය නිසා ය.
4. ප්‍රයෝග සම්පත්තිය නිසා ය.

(14) ලොව සියල්ල මොහොතින් මොහොත වෙනස් වෙයි. කිසිවක ස්ථිරසාර පැවැත්මක් නැත. මෙම ලක්ෂණය නම්,

1. අනිත්‍ය ලක්ෂණය යි.
2. දුක්ඛ ලක්ෂණය යි.
3. අනාත්ම ලක්ෂණය යි.
4. ආත්ම ලක්ෂණය යි.

(15) බෞද්ධයාගේ ඒකායන අරමුණ වන්නේ නිවන් අවබෝධය යි. ඒ සඳහා උපකාර වන්නේ,

1. ශ්‍රද්ධාව යි.
2. සීලය යි.
3. ප්‍රඥාව යි.
4. ධ්‍යානය යි.

(16) "ඔබ වහන්සේ පැවිදි වූයේ කවරෙකු උදෙසා ද? ඔබ වහන්සේගේ ගුරුතුමා කවරෙක් ද? කාගේ දහමක් ද, ඔබ වහන්සේ රුචි කරන්නේ?" මෙසේ විමසා සිටියේ,

1. කොණ්ඩඤ්ඤ තවුසා ය.
2. උපතිස්ස පරිබ්‍රාජකයා ය.
3. කෝලිත පරිබ්‍රාජකයා ය.
4. සුභ මානවකයා ය.

(17) බුදු දහමේ මූලික හරය නම් පටිච්ච සමුප්පාද ධර්මයයි. 'පටිච්ච සමුප්පාද' යන යෙදුමෙන් ප්‍රකාශ නොවන්නේ,

1. සහේතුක බව යි.
2. හේතු සහිත බව යි.
3. අහේතුක බව යි.
4. අහේතුක නොවන බව යි.

(18) සමාජ ගැටලු ඇති වූ ආකාරය මෙන් ම ඇති වන ආකාරය ද පැහැදිලි කෙරෙන දේශනා තුළ විග්‍රහ කෙරෙන්නේ,

1. කර්ම න්‍යායයි.
2. ප්‍රතීත්‍ය සමුප්පාද න්‍යායයි.
3. ලෝක න්‍යායයි.
4. භෞතික න්‍යායයි.

(19) දම්සක් පැවතුම් සූත්‍රය අනුව ඉපදීම, වයසට යාම, ලෙඩවීම, මරණයට පත් වීම, ප්‍රියයන්ගෙන් වෙන්වීම යන කරුණු පෙන්නුම් කෙරෙන්නේ,

1. දුක්ඛ ආර්ය සත්‍යයේ ය.
2. දුක්ඛ සමුදය ආර්ය සත්‍යයේ ය.
3. දුක්ඛ නිරෝධාර්ය සත්‍යයේ ය.
4. දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදා ආර්ය සත්‍යයේ ය.

(20) සියලු සත්ත්වයන්ගේ ජීවනාලිය රඳාපවතින්නේ පරිසරය මුල්කරගෙන ය. මිනිසාගේ පරම යුතුකම විය යුත්තේ,

1. පරිසරය පිළිබඳ ව අධ්‍යයනය කිරීම යි.
2. පරිසරය ආරක්ෂා කිරීම යි.
3. පරිසරය ප්‍රයෝජනයට ගැනීම යි.
4. පරිසරය විඳීම යි.

(21) සිදුහත් කුමරු ගිහිගෙය හැර ගොස් 'කිං කුසලගවේසී' ව කටයුතු කළ වකවානුවේ දිවි ගෙවූයේ,

1. අනෝමා ගංතීරයේ ය.
2. කුකුත්තා නදී තීරයේ ය.
3. නේරංජනා නදී තීරයේ ය.
4. රෝහණී නදී තීරයේ ය.

(22) පරමාදර්ශී බුද්ධ චරිතයෙන් ලෝකයට පළමුව ලබාදුන් ආදර්ශය වන්නේ කළ ගුණ සැලකීමයි. එය ඉටු කරන ලද්දේ බුද්ධත්වයෙන්,

1. පළමු සතියේදී ය.
2. දෙවන සතියේදී ය.
3. තෙවන සතියේදී ය.
4. සිව්වන සතියේදී ය.

(23) බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරයේ වස් විසූ ස්ථාන රාශියක් බුදු සිරිතෙන් ප්‍රකට වේ. ඉන් පස්වන වස් කාලය ගත කළේ,

1. බරණැස ඉසිපතන මිගදායේ ය.
2. විශාලා මහනුවර කූටාගාර ලෙනෙහි ය.
3. මකුල පර්වතයෙහි ය.
4. භේෂකලා පර්වතයෙහි ය.

(24) බුදුරජාණන් වහන්සේ මහී ගංගා තීරයේදී සොඳුරු සවස් භාගයක දේශනා කළ සූත්‍රය නම්,

1. සාමඤ්ඤ ඵල සූත්‍රය යි.
2. ටනීය ගෝපාල සූත්‍රය යි.
3. සෝණදණ්ඩ සූත්‍රය යි.
4. සිංසපා සූත්‍රය යි.

(25) ගිරිමානන්ද සූත්‍රයේ සඳහන් අන්දමට රෝග වැළඳීමට බලපාන හේතු ගණන,

1. 6 කි.
2. 7 කි.
3. 8 කි
4. 10 කි.

(26) බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වන අනුන්ගේ අත් උදවු නැතිව නැගිටින්නට බැරි තරමට අධික ව ආහාර ගන්නා තැනැත්තා හඳුන්වන්නේ,

1. ආහාර හත්ථක ලෙස ය.
2. අලංසාටක ලෙස ය.
3. තත්ථාවට්ටක ලෙස ය.
4. භුත්තවමිතක ලෙස ය.

(27) කණිෂ්ක රජතුමා විසින් අනුග්‍රහය දක්වන ලද සිව්වන ධර්ම සංගායනාවට සහභාගී වූ භික්ෂූන් වහන්සේලා,

1. ථේරවාදී භික්ෂූන් වහන්සේලා ය.
2. මහායාන භික්ෂූන් වහන්සේලා ය.
3. වජ්ජි පුත්තක භික්ෂූන් වහන්සේලා ය.
4. සර්වාස්තිවාදී භික්ෂූන් වහන්සේලා ය.

(28) ස්තූප ගර්භයේ ස්වරූපය අනුව සයාකාර ය. ඉන් ධාන්‍යාකාර ස්තූපයකට උදාහරණයක් වන්නේ,

1. රුවන්මැලි මහා ස්තූපය යි.
2. ජේතවනාරාම ස්තූපය යි.
3. අභයගිරි ස්තූපය යි.
4. කැලණි ස්තූපය යි.

PAST PAPERS WIKI

29) කලාත්මක බවින් අනූන වටදාගෙවල් සඳහා උදාහරණයකි,
1. ථූපාරාමය-අම්බස්තලය
2. ලංකාරාමය-මැදිරිගිරිය
3. ලංකාරාමය-ථූපාරාමය
4. පොලොන්නරුව-මැදිරිගිරිය

30) මෙතෙක් හමු වී ඇති කලාත්මක බවින් උසස් ම බෝධිඝරය පිහිටා ඇත්තේ,
1. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ය.
2. පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ය.
3. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ය.
4. මහනුවර දිස්ත්‍රික්කයේ ය.

31-32 ප්‍රශ්න සඳහා පහත දී ඇති විස්තරය පදනම් කරගෙන පිළිතුරු සපයන්න.

බෞද්ධ සිතුවම් කලාව ලංකාව පුරා ම විහිදී ගිය ද, අද දක්නට ඇත්තේ ස්වල්ප වූ ස්ථාන කිහිපයක පමණි. එයින් කිහිපයක් පහත දැක්වේ.
* සීගිරිය
* හිඳගල
* මහියංගණ ස්තූප ගර්භය
* දිඹුලාගල
* තිවංක පිළිමගෙය
* මහනුවර දළදා මාලිගාව

(31) ඉහත දක්වා ඇති කොටසින් අනුරාධපුර යුගයට අයත් චිත්‍ර දක්නට ලැබෙන්නේ,
1. සීගිරිය හා දිඹුලාගල ය.
2. සීගිරිය හා හිඳගල ය.
3. දිඹුලාගල හා තිවංක පිළිමගෙය ය.
4. හිඳගල හා මහියංගණ ස්තූප ගර්භය ය.

(32) බුදුරජාණන් වහන්සේ දෙව්ලොව සිට සංකස්ස පුරයට වැඩම කිරීම, සස, වෙස්සන්තර, සාම ආදි ජාතක කතා සිතුවමට නගා තිබීම දක්නට ඇත්තේ,
1. දිඹුලාගල චිත්‍රවල ය.
2. තිවංක පිළිමගෙය චිත්‍රවල ය.
3. හිඳගල චිත්‍රවල ය.
4. සීගිරියේ චිත්‍රවල ය.

(33) ගුරුළුගෝමී පඬිතුමා විසින් පාලි බෝධිවංශය පදනම් කරගෙන රචනා කරන ලද ධර්ම ග්‍රන්ථය වන්නේ,
1. අමාවතුර යි.
2. ධර්ම පුදීපිකාව යි.
3. බුත්සරණ යි.
4. පූජාවලිය යි.

(34) භාරතීය අලංකාර ශාස්ත්‍රය පදනම් කරගෙන නිර්මාණය වූ සිංහලයේ විශිෂ්ටතම මහා කාව්‍ය කවිසිළුමිණ යි. මෙම ග්‍රන්ථය රචනා කිරීමට තේමා කරගෙන ඇත්තේ,
1. සස ජාතකය යි.
2. වෙස්සන්තර ජාතකය යි.
3. කුස ජාතකය යි.
4. සත්තුභත්ත ජාතකය යි.

(35) යහපත් රාජ්‍ය පාලනයක් සඳහා බුදුරජාණන් වහන්සේ දේශනා කළ දස සක්විතිවත් ඇතුළත් වන්නේ,
1. කූටදන්ත සූත්‍රයේ ය.
2. අග්ගඤ්ඤ සූත්‍රයේ ය.
3. චක්කවත්ති සීහනාද සූත්‍රයේ ය.
4. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ ය.

(36) නිතර නිතර රැස්වීම, සමගි ව රැස් ව සමගි ව සාකච්ඡා කොට සමගි ව විසිර යාම යන කරුණු ඇතුළත් වන්නේ,
1. දස සක්විතිවත්වල ය.
2. දස රාජධර්මවල ය.
3. සතර සංග්‍රහ වස්තුවල ය.
4. සප්ත අපරිහානීය ධර්මවල ය.

(37) යම් පුද්ගලයෙකු ත්‍රිවිධ රත්නය පිළිබඳ ව කරුණු දැන ඇති කර ගන්නා පැහැදීම,
1. අමූලිකා ශ්‍රද්ධාව යි.
2. අවෙච්චප්පසාදය යි.
3. අනුසෝතගාමී ප්‍රතිපදාව යි.
4. චිත්ත ප්‍රසාදය යි.

(38) ආර්ය මහා සංඝරත්නය මනා වූ පිළිවෙත් පුරන නිසා,
1. සුපටිපන්න ගුණයෙන් යුක්ත ය.
2. උජුපටිපන්න ගුණයෙන් යුක්ත ය.
3. ඤායපටිපන්න ගුණයෙන් යුක්ත ය.
4. සාමීචිපටිපන්න ගුණයෙන් යුක්ත ය.

(39) බෞද්ධයන්ගේ අවමංගල අවස්ථාවන්හි ආගමික කටයුතු සිදුකරනු ලබන්නේ,
1. උපාසක පිරිස විසිනි.
2. නිවසේ සාමාජිකයන් විසිනි.
3. විහාරස්ථානයේ මහා සංඝරත්නය විසිනි.
4. ග්‍රාමවාසී වැඩිහිටියන් විසිනි.

(40) ජලය කැළඹී ඇත්නම් එහි කිසිවක් නොපෙනේ. එමෙන් ම සිත කැළඹුණු විට, නොසන්සුන් වූ විට මතකය අවධි නොවේ. නීවරණ ධර්මයන්ට අනුව මෙම ලක්ෂණය වන්නේ,
1. කාමච්ඡන්දය යි.
2. ව්‍යාපාදය යි.
3. ථීනමිද්ධය යි.
4. උද්ධච්ච කුක්කුච්චය යි.

(ලකුණු 1 × 40 = 40)

සියලු හිමිකම් ඇවිරිණි
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2026
ஆண்டிறுதி மதிப்பீடு
Year End Evaluation

ශ්‍රේණිය தரம் Grade	විෂයය பாடம் Subject	පත්‍රය வினாத்தாள் Paper	කාලය காலம் Time
10	බුද්ධ ධර්මය	II	

II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළු ව තවත් ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

---

(01) (i) සිදුහත් කුමාරයා ඉගෙන ගත් ශිල්ප දෙකක් ලියන්න.

(ii) භික්ෂූන් වහන්සේලාගෙන් සිදුවන සමාජ සේවා දෙකක් ලියන්න.

(iii) පස්වග තවුසන්ගෙන් දෙදෙනෙකු නම් කරන්න.

(iv) "චිත්තං සමේජයිති සම්මථෝ" යන පාඨයෙහි තේරුම ලියන්න.

(v) 'නීවරණ' යන්නෙහි අර්ථය ලියන්න.

(vi) උත්තම පෞරුෂ ඇති පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න.

(vii) "ආරෝග්‍ය පරමා ලාභා ...." යන පාඨයෙහි තේරුම ලියන්න.

(viii) බුදුරජාණන් වහන්සේ විසින් විනයෙහි අනු දැන වදාරා ඇති ආහාර-පාන ගැනීමේ දී අනුගමනය කළ යුතු සිරිත් විරිත් දෙකක් ලියන්න.

(ix) අලුවිහාර ධර්ම සංගායනාව හඳුන්වන වෙනත් නමක් ලියන්න.

(x) සඳකඩපහණෙහි දක්නට ලැබෙන කැටයම් වර්ග දෙකක් ලියන්න.

(ලකුණු 2 × 10 = 20)

(02) (i) සිදුහත් බෝසතාණන් වහන්සේ අභියෝග ජයගත් අවස්ථා දෙකක් ලියන්න.

(ii) ඉන් එක් අවස්ථාවක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) සිදුහත් බෝසත් චරිතය ඇසුරෙන් අපට අභියෝග ජයගත හැකි ආකාරය උදාහරණ තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(03) (i) කණිෂ්ක සංගීතියෙහි ප්‍රධානත්වය හා සහාපතිත්වය පැවරූ තෙරවරුන් දෙදෙනාගේ නම් ලියන්න.

(ii) කණිෂ්ක ධර්ම සංගායනාවේ ප්‍රතිඵල තුනක් ලියන්න.

(iii) ශාසන විරස්ථිතිය සඳහා අලුවිහාර ධර්ම සංගායනාව හේතු වූ ආකාරය කරුණු සහිත ව පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(04) (i) "උට්ඨානවතෝ සතිමතෝ ...." යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.

(ii) එම ගාථාවේ අර්ථය ලියන්න.

(iii) මෙම ගාථාවේ එන දහම් කරුණු ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

Past Papers Wiki

(05) (i) සිගාලෝවාද සූත්‍රයේ උඩ දිසාව හා යට දිසාව නියෝජනය කරන සමාජ කණ්ඩායම් දෙක නම් කරන්න.

(ii) පැවිදි උතුමන් විසින් ගිහියන් සඳහා ඉටු කරනු ලබන යුතුකම් තුනක් ලියන්න.

(iii) පැවිදි උතුමන්ගේ අනුශාසනා සමාජය යහපත් කරගැනීමට හේතුවන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(06) (i) බුදු දහමේ කර්ම රැස් කරන ආකාර තුනකි. ඉන් දෙකක් ලියන්න.

(ii) වචනයෙන් සිදු කරනු ලබන අකුසල කර්ම තුනක් ලියන්න.

(iii) කර්මය පිළිබඳ ඉගැන්වීම පුද්ගල මෙන් ම සමාජ දියුණුවට බලපාන ආකාරය විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(07) පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) දුටුගැමුණු රජතුමා

(ii) සතර සංග්‍රහවස්තු

(iii) සද්ධර්ම රත්නාවලිය

(iv) සඳකඩපහණ

(ලකුණු 5 + 5 = 10)

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2026
Year End Evaluation

ශ්‍රේණිය தரம் Grade	10	විෂයය பாடம் Subject	බුද්ධ ධර්මය	පත්‍රය வினாத்தாள் Paper		කාලය காலம் Time	

නම / අනු අංකය :- .....

පිළිතුරු පත්‍රය

01. 02	11. 04	21. 03	31. 02
02. 04	12. 03	22. 02	32. 02
03. 03	13. 02	23. 02	33. 02
04. 02	14. 01	24. 02	34. 03
05. 01	15. 03	25. 03	35. 03
06. 02	16. 02	26. 01	36. 04
07. 02	17. 03	27. 04	37. 02
08. 01	18. 02	28. 04	38. 01
09. 02	19. 01	29. 04	39. 03
10. 02	20. 02	30. 03	40. 04

(ල : 1 × 40 = 40)

01) (i) කඩු ශිල්ප, දුනු ශිල්ප, හස්ති ශිල්ප, අශ්ව ශිල්ප, නීති ශාස්ත්‍රය

(ii) වැඩිහිටි නිවාස පවත්වාගෙන යාම, ආබාධිතයින් සඳහා ආබාධිත සරණ සේවා, ශිෂ්‍යත්ව ලබාදීම, රණවිරු සේවා, වෛද්‍ය සායන පැවැත්වීම

(iii) කොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම, අස්සජි

(iv) සිත සන්සුන් කරන්නේ සමථයයි.

(v) සිත කිලිටි කරන, කුසල් සිතුවිලිවලට බාධා කරන, නිවන අහුරාලන

(vi) බුදු, පසේ බුදු, මහරහත්

(vii) නිරෝගීකම උතුම් ම ලාභයයි.

(viii) ඉඳුල් අතින් භාජන නොඇල්ලීම, අත ගසා දමමින් ආහාර නොගැනීම, සුරු සුරු හඬ නගමින් ආහාර නොගැනීම ආදි.... (පෙළපොත 99 පිටුව)

(ix) පුස්තකාරූඪ ධර්ම සංගීතිය, හතරවන ථේරවාදී ධර්ම සංගායනාව

(x) මල් ලියවැල්, සත්ත්ව රූප, පලාපෙති මෝස්තර

02) (i) පංචමහා විලෝකනය බැලීම, ශිල්ප දැක්වීම, පස්කම් සුව අත්හැරීම, සතර පෙර නිමිති දැකීම, විවාහය ආදි....

(ii) පෙළපොතේ පළමු පාඩම බලන්න. කෙටියෙන් හඳුන්වා ඇත්නම් ලකුණු දෙන්න.

(iii) පිළිතුරු සමස්තයක් ලෙස ගෙන උදාහරණ තුනක් මගින් විස්තර කර ඇත්නම් ලකුණු පිරිනමන්න.

(ල : 2 + 3 + 5 = 10)

PAST PAPERS WIKI

03) (i) ප්‍රධානත්වය - පාර්ශ්ව තෙරුන්
සභාපතිත්වය - වසුමිත්‍ර තෙරුන්

(ii) පෙළපොත පිටු අංක 106 බලන්න.

(iii) පෙළපොත ඇසුරින් කරුණු 4 ක්වත් ඇතුළත් කර පිළිතුර සකස්කර ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.
(පෙළපොත පිටු අංක 104, 105 පිටු බලන්න.)

(ල : 2 + 3 + 5 = 10)

04. (i) උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ
සඤ්ඤතස්ස ච ධම්මජීවිනෝ - අප්පමත්තස්ස යසෝභි වඩ්ඪති

(ii) උත්සාහවන්ත වූ, මනා සිහිය ඇති, නිවැරදි ක්‍රියා ඇති, නුවණින් පිරික්සා බලා කටයුතු කරන, හික්මීමෙන් යුත්, දැහැමි ව ජීවත් වන, අප්‍රමාදී පුද්ගලයාගේ යසස වැඩෙන්නේ ය.

(iii) කරුණු පහක්වක් ඇතුළත් පිළිතුරකට සම්පූර්ණ ලකුණු පිරිනමන්න.

(ල : 2 + 3 + 5 = 10)

05) (i) උඩ දිසාව - පැවිදි උතුමන්
යට දිසාව - සේව්‍ය සේවකයින්

(ii) පවින් වැළැක්වීම, යහපත් ක්‍රියාවල යෙදවීම, හොඳ හිතින් අනුකම්පා කිරීම, අසා නොමැති දේ කියාදීම, අසා ඇති දේ වඩාත් පැහැදිලි කරදීම, සුගතියට මග කියාදීම

(iii) දරුවන් ලියා ඇති පිළිතුරු දෙස බලා සමස්තයක් ලෙස ගෙන ලකුණු පිරිනමන්න.

(ල : 2 + 3 + 5 = 10)

06) (i) කයින්, වචනයෙන්, සිතින්

(ii) මුසාදාසා, පිසුණාවාචා, පරුසාවාචා, සම්පප්‍රලාපා

(iii) කරුණු සහිත ව ලියා ඇත්නම් සමස්තයක් ලෙස ගෙන ලකුණු පිරිනමන්න.

(ල : 2 + 3 + 5 = 10)

07) (i) **දුටුගැමුණු රජතුමා**

පෙළපොත පිටු 37 - 39 බලන්න.

(ii) **සතර සංග්‍රහ වස්තු**

පෙළපොත පිටු 127 - 128 බලන්න.

(iii) **සද්ධර්මරත්නාවලිය**

පෙළපොත පිටු 121 බලන්න.

(iv) **සඳකඩපහණ**

පෙළපොත පිටු 113 - 114 බලන්න.

(ල : 5 + 5 = 10)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library